# ලග්ගල ප්‍රදේශයේ ගැමි ජීවිතය හා බැඳුණු සිරිත් විරිත් පිළිබඳ අධ්‍යයනයක්

එච්.ඒ.ඩබ්ලිව්. චතුරිකා[1], එම්.ඒ.එන්.පී. මල්ලවආරච්චි[2], එම්.ඒ.පී. ප්‍රශාද්[3]

මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රණමුරේ, නාරංගමුව හා ඇටැන්වලමේ යන ගම්මාන වටා මෙම අධ්‍යයනය සිදුකර ඇත. එහිදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රය ක්ෂේත්‍ර අධ්‍යයන, සම්මුඛ සාකච්ඡා යොදා ගැනුණි. රාවණා පරපුරේ පිරිස් වත්මන් සමාජයට සුවිශේෂී වීමට හේතු සෙවීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ලග්ගල ප්‍රදේශයේ සිරිත් විරිත් එම සමාජයට කළ බලපෑම මෙයින් අධ්‍යයනය කරනු ලබයි. ලකේගල ජනතාව උපතේ සිට මරණය දක්වා විවිධ සිරිත් විරිත් අනුගමනය කර ඇත. මෙහි ගැමියන් දරුවෙකු පිළිසිඳගත් දින පටන් ප්‍රසූතිය දක්වාම ආගමට මුල් තැන දී කටයුතු කරනු ලැබේ. දරු ප්‍රසූති අවස්ථාවේ දී වින්නඹු මාතාවගේ සහායට පැමිණෙන ආවතේවකාරිය පිරිත් පැදුර, වැදුම්ලන්තය, දරුවැල කපන නූල හා ආයුධය, පිත්තල තැටිය ද යොදා ගනී. ළදරුවා උපන් පසු රන්කිරි කටගෑමත්, ඉඳුල් කටගෑමත්, දැරියන්ගේ කන් විදීම යන චාරිත්‍රයන් කරන අතර එය ''කන නූල් කිරීම,කන් කෝඩු දැමීම" නම් වේ. දැරියකගේ මල්වර කටයුත්ත රෙදි ඇපුළුම් කුලයේ ස්ත්‍රියක් වන රෙදි නැන්දා විසින් සිදු කරන අතර වැඩිවියට පත් දැරිය විවාහය තෙක් දෙමව්පියන් විසින් රැකබලා ගනී. විවාහයේ දී පෝරුවේ චාරිත්‍ර අතර මනමාලයා විසින් ''කුඩිපැහුම් සේලය" නම් සුදුරෙද්දක් මනමාලියගේ ඉනවටේ පටලයි. කාන්තාවගේ පාරිශුද්ධභාවය පරීක්ෂා කිරීමට මෙම ඉණකඩ මනමාලයාගේ දෙපතුල මත එලා නමස්කාරය කරයි. මරණ අවස්ථාවක දී වෙදරාල, කපුරාල, වෙල් විදානේ, ගමරාල හා පන්සලේ හිමි නම ද මලගෙදරට වඩින එක සිරිතකි. මිනිය සොහොන් කනත්තට ගෙන යාමේ දී සතුන්ගෙන් සිදුවිය හැකි අනතුරුවලින් ආරක්ෂා වීමට මිනියට ඉදිරිපසින් පීරංගාකාරයෝ දෙදෙනෙක් සහ කොටන තුවක්කු දෙකක් ගත් වෙඩික්කාරයෝ දෙන්නෙක් ගමන් ගනී. කෝණ මංගල්‍යය, වෙසක් හා විහාරගේ මංගල්‍යය, දේවාල හා කිරි ඉතිරුම් මංගල්‍යය මේ අතර ප්‍රධාන චාරිත්‍ර කීපයකි. කෝණ මංගල්‍යය එළඹුණු බව සන්නිවේදනය කරනු ලබන්නේ පන්සලේ හඬකඳ නාදවීමත් සමඟය. ලකේගල ගම්වැසියන් අස්වනු නෙළාගත් පසු කිරි ඉතිරුම් මංගල්‍යය කරන අතර හරක් පට්ටිවල ආරක්ෂාවට මෙන්ම සුබ කටයුතු අරබයා ද කිරි ඉතිරුම් සිදු කරයි. ඉර මූලික කරගෙන සූර්යය වන්දනාව අදටත් සිදු කරනු ලබයි. ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වූ අතර වගාවේ මුල් කොටස දෙවියන් උදෙසා විය. එය අඩුක්කු පිදීම නම් විය. ලකේගල රාවණා පරපුර නොහොත් යක් පරපුර පිළිබඳව ඉතිහාසයේ සඳහන්ය. යන්ත්‍ර මන්ත්‍ර, බලිතොවිල්, ගුප්ත විද්‍යා කටයුතු සම්බන්ධයෙන් ප්‍රචලිත දස්කම්, සිරිත් විරිත් ආරක්ෂා කරගනිමින්, රාවණා දෙවියන් යදින පිරිසක් මෙම පුරවරයේ නිහඬව කල් ගෙවති.

ප්‍රමුඛ පද : ලකේගල, ගැමි ජීවිතය, රාවණා පරපුර, කුඩිපැහුම් සේලය, ඓතිහාසික අධ්‍යයනය

---

[1 2 3] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. wasanthichathurika96@gmail.com